# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.09.29 පැය 1555 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1817/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පස් කන්දකට යටවීමෙන් පුද්ගලයින් තිදෙනෙකු මිය යාම - මාවනැල්ල පොලිස් වසම.**

2025.09.29 වන අද දින දහවල් කාලයේ මාවනැල්ල පොලිස් වසමේ හිඟුල ප්‍රදේශයේදී ගල්බැම්මක් ඉදිකරමින් සිටි පුද්ගලයින් තිදෙනෙකු මතට පස්කන්දක් කඩා වැටී ඇති බවට මාවනැල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමර්ශන ආරම්භ කර ඇත.

කඩිනමින් ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන් ප්‍රදේශවාසීන්ගේ සහය සහිතව පස් කන්දට යටවී සිටි පුද්ගලයින් තිදෙනා මුදාගෙන මාවනැල්ල රෝහලට ප්‍රතිකාර සඳහා ඇතුලත් කිරීමට කටයුතු කර ඇති අතර රෝහල් ගත කිරීමෙන් පසු ඔවුන් තිදෙනා මිය ගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 43,47 හා 63 වයස් වල පසුවන මාවනැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර පශ්චාත් මරණ පරීක්ෂණ සඳහා මාවනැල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මාවනැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**